# මහනුවර යුගයේ රදා කුලප්‍රාප්ත රාජකීය මලබාර් ඥාතිවරු හා ඔවුන්ගේ සමාජ පරිවර්තනය පිළිබඳව මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

ඊ. විනීතධම්ම හිමි[1], ඒ. අනෝමදස්සි හිමි[2]

ඉන්දියාවේ මදුරාසියේ සිට පැමිණි කන්නසාමි කුමාරයා වර්ෂ 1798 දී ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් මෙරට සිංහාසනාරූඪ වූ බව ඉතිහාසයේ සඳහන් වේ. ඔහු 1815 දී දේශීයයන්ගේ පාවාදීම නිසා ඉංග්‍රීසීන්ගේ ගැලවීමට රාජ්‍ය පවා අතහැර පලායන්නේ සිය බිසෝවරු දෙදෙන හා මව්බිසව පමණක් රැගෙනය. මෙම රාජ පිරිස ඉන්දියාවෙන් පැමිණි පිරිසක් නිසාවෙන් ඔවුන් සමඟ පැමිණි රාජකීය ඥාති පිරිසක් රජවාසල සමීපයේ මලබාර් වීදියේ පදිංචිව සිටි බව සඳහන් වේ. දුල්ලෑව වලව්ව හෙවත් වර්තමාන මහනුවර කිංස්ටන් හෝටල් ගොඩනැගිල්ල රජුගේ මෙම මලබාර් ඥාතීන් විසූ ස්ථානයක් බවට ජනප්‍රවාදයක් ද තිබේ. රාජසිංහ රජුගේ හදිසි පලායාම නිසා මල්බාර් විදීයේ වාසය කළ මහබිසවගේ රාජකීය ඥාති පිරිස ආරක්ෂා කරදෙන මෙන් බාරදෙනු ලබන්නේ ඒ වනවිට රදා කුලෙන් කිළුටු රෙදි ගෙන යාමට මාලිගයට පැමිණ සිටි සිංහල මිනිසුන් කිහිප දෙනෙකුටය. මෙම රදා කුලවාසීන් මෙම රාජකීය ඥාතීන් ආරක්ෂා කිරීමේ වගකීම බාරගෙන ඔවුන් ඉංග්‍රීසින්ට හසු නොවන ලෙසින් ආරක්ෂා කළ අතර කාලයාගේ ඇවෑමෙන් මෙම රදා කුලවාසීන් හා ඔවුන් ඒකාබද්ධ විය. මල්බාර් වීදියේ විසූ රාජකීයයන්ට රදා කුලයන්ගේ චාරිත්‍ර වාරිත්‍ර පවා ඉගෙන ගැනීමටත් ඔවුන්ගේ ජීවන රටාවට අනුගත වීමටත් ඔවුන්ට සිදුවිය. රජවාසලේ රෙදි අපුල්ලන්නන්ගේ ආරක්ෂාව යටතේ සිටි මොවුන් එම කුලයේ රාජකාරිය පවා ඉගෙන ගැනීමට සිදු වූයේ ඉංග්‍රීසින්ගෙන් සිය ජීවිත රැකගැනීම පිණිසය. රජවාසලෙන් පැමිණි මුල් කාලයේ හන්තානේ උඩුවෙල ප්‍රදේශයේ ඇළක් සමීපයේ වාසය කළ මොවුන් ඉනික්බිති හන්තාන කොටියාවල, නාගස්තැන්න, සුදුහුම්පොළ ප්‍රදේශවලට ජල මාර්ගය ඔස්සේ කෙමෙන් සංක්‍රමණය විය. මෙම රාජකීය පිරිසෙන් පැවත එන්නේ යයි සැළකෙන පිරිසක් වර්තමානයේත් මහනුවර දෙයියන්නේවෙල ටැංකිවත්ත ප්‍රදේශයේ ජීවත් වන අතර මල්බාර් වීදියේ විසූ රාජකීයයන්ගේ ජීවන පරිවර්තනය එලෙසින් සිදුවිය. මහනුවර ටැංකිවත්ත ප්‍රදේශයේ වර්තමානයේ ජීවත් වන රාජකීය පරම්පරාවේ යයි විශ්වාස කරන ඔවුන්ගේ මව් බස තෙළිඟු වන අතර ජීවනෝපාය වන්නේ ද රෙදි ඇපිල්ලීමයි. ඔවුන් තමන්ගේ ප්‍රධාන ආගමික ශාස්තෘවරයා වශයෙන් සළකන්නේ විශ්ණු දෙවියන්ය. 'මහනුවර තෙළිඟු වංශිකයන්' වශයෙන් සැළකෙන මොවුන්ගේ ප්‍රධාන ආගමික මධ්‍යස්ථානය වන්නේ ඉන්දියාවේ තිරුපති කෝවිලයි. උඩරට අවසන් අගබිසව වූ වෙන්කතරෙංග ජෙම්මාල් බිසවගේ ඥාති පිරිසෙන් තමන් පැවත එන්නා බවට විශ්වාස කරන මොවුන් වර්තමානයේ ඔවුන්ටම ආවේණික වූ සංස්කෘතියක් සහිතව ජීවත් වෙති.

ප්‍රමුඛ පද ඃ මලබාර්, සමාජ පරිවර්තනය, රදා කුලය, රාජකීය ඥාතීන්

[1] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.vineethadhamma111@gmail.com
[2] භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. anomadassi156@gmail.com